බස්නාහිර පළාතේ

2009 අංක 02 දරණ

මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

නම් වූ

මෙම ප්‍රඥප්තිය

2009 ජනවාරි මස 20 වන දින පැවැති

බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීමේදී

සභා සම්මත වූ බව

සහතික කරමි.

දිනය : 2009/01/26

ජගත් අංගගේ,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව

ජගත් අංගගේ
සභාපති.
බස්නාහිර පළාතේ පළාත් සභාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

අනුඥාව ලබා දෙමි

දිනය: 2009-01-28 එස්. අලවි මව්ලානා
ආණ්ඩුකාරවර.
බස්නාහිර පළාත.

දිනය : 2009-01-28

එස්. අලවි මව්ලානා,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත

# බස්නාහිර පළාතේ 2009 අංක 02 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.

2006 අංක 02 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2009 අංක 02 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් අත්සන් කරනු ලැබීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ 11 වන වගන්තිය 11 (1) වගන්තිය ලෙස මෙයින් සංශෝධනය කරනු ලැබේ. ඉන් ඉක්බිතිව පහත දැක්වෙන අළුත් උප වගන්ති ඇතුලත් කරනු ලබන අතර, එම උප වගන්ති 11 (2). 11(3). 11(4). 11(5) හා 11(6) ලෙසට බලාත්මක විය යුතු ය.

*විකුණුම් වලින් රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් අය කිරීම.*

11 (2) මේ ප්‍රඥප්තියේ කුමක් සඳහන් ව තිබුන ද යම් ආනයනකරුවෙකු, නිෂ්පාදකයෙකු හෝ විකුණුම්කරුවෙකු විසින් යම් පාරිභෝගික ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් නැවත විකිණීම සඳහා (මින් මතු "මිලට ගන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තෙකුට හෝ ආයතනයකට විකුණනු ලබන අවස්ථාවක ඒ විකිණීම මත එළඹුනු ගණුදෙනුව වෙනුවෙන් ලැබුණු හෝ ලබා ගැනිමට හැකි මුදල් ප්‍රමාණයෙන් ඒ පාරිභෝගික ද්‍රව්‍යය හෝ භාණ්ඩය සඳහා 7(1) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කලින් කලට ගැසට් නිවේදනයක් මගින් නියම කරනු ලබන පිරිවැටුම් බදු අනුප්‍රමාණය මත ගණන් බලන ලද මුදලක් රඳවා ගැනිමේ පිරිවැටුම් බද්දක් ලෙස අය කර ගත යුතු ය.

*ලියාපදිංචි කිරීම.*

(3) (අ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව හෝ රඳවා ගැනිමේ පිරිවැටුම් බද්දක් අය කරනු ලැබිය හැකි ගණුදෙනුවක් කරන සෑම තැනැත්තෙකු හෝ ආයතනයක්ම මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කර ගනු ලැබිමට යටත් විය යුතු ය.

(ආ) (අ) අනු වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබිමට යටත් සෑම තැනැත්තෙකු හෝ ආයතනයක්ම ලියාපදිංචි කරනු ලැබිමට යටත් වූ දින සිට දින 30ක් ඇතුලත ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලිමක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) (අ) අනු වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා බදු අයකළ හැකි ගණුදෙනු වලට අදළව තොරතුරු කොමසාරිස්වරයා විසින් කවර හෝ අවස්ථාවක ඉල්ලා සිටිය හැක.

(ඈ) (අ) අනු වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට යටත් සෑම තැනැත්තෙකු හෝ ආයතනයක්ම (ආ) අනු වගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි වීම සඳහා ඉල්ලිමක් ඉදිරිපත් කරනු ලැබූ විට එම තැනැත්තා හෝ ආයතනය කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කර ගනු ලැබිය යුතු ය. කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තෙකු හෝ ආයතනයක් ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු .

(i). ලියාපදිංචි කිරීමේ අංකයක් සහ
(ii). ලියාපදිංචි කිරීමේ සහතිකයක්

එම තැනැත්තා හෝ ආයතනය වෙත නිකුත් කල යුතු ය.

(ඉ) සෑම ලියාපදිංචි තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් ම.

(i) එම තැනැත්තා හෝ ආයතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාර නාමයෙහි හෝ ව්‍යාපාරය පිහිටි ස්ථානයෙහි හෝ එහි ලිපිනයෙහි හෝ

(ii) ඒ තැනැත්තා හෝ ආයතනය විසින් නිකුත් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අයකළ හැකි ගණුදෙනු ස්වභාවයේ හෝ හිමිකමේ හෝ අයිතියේ හෝ

යම් වෙනසක් සිදුවු විට එම වෙනස්කම සිදුවි දින 14 ක් ඇතුළත කොමසාරිස්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

අනුමැතිය ලබා දෙමි

දිනය 2009 .. 28 වන. ඇල්වි මව්ලානා
ආණ්ඩුකාරවර.
බස්නාහිර පළාත.

*රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් අය කොට වවුචරයක් නිකුත් කිරීම. කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරීම හා පිරිවැටුම් බද්ද [illegible] කිරීම [illegible] කිරීම.*

(4) (අ) (2) උප වගන්තියේ විධිවිධාන අනුව රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද අඩුකර ගන්නා සෑම ආනයනකරුවකු, නිෂ්පාදකයකු හෝ විකුණුම්කරුවෙකු විසින් ම, ඒ ගනුදෙනුව සම්බන්ධයෙන්,

(i) ගනුදෙනුව එළඹුනු දිනය, ස්ථානය හා පාරිභෝගික ද්‍රව්‍ය වල හෝ භාණ්ඩ වල වර්ගය,
(ii) එළඹුනු ගනුදෙනුවේ වටිනාකම,
(iii) එම තැනැත්තාගේ හෝ ආයතනයේ නම හා ලිපිනය සහ
(iv) ඒ ගනුදෙනුවට ආරෝපනය කල හැකි රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද

දක්වමින් වවුචරයක් නිකුත් කල යුතු ය.

(ආ) රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද අයකර ගැනීමට යටත්වන් සෑම ගනුදෙනුවකින් පෙනෙනපරිදි, එම ගනුදෙනුව සිදු වූ කාර්තුව සඳහා රඳවා ගත් පිරිවැටුම් බදු මුදල, එම රඳවා ගත් දින සිට දින මසක් ඇතුළත කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කල යුතු ය.

(ඇ) පිරිවැටුම් බද්දට යටත් යම් මිලට ගන්නෙකුගේ පිරිවැටුමෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති පරිදි රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද අය කර ගන්නා ලද යම් පාරිභෝගික ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් විකිණීමෙන් ලබා ගන්නා ලද හෝ ලැබිය යුතු මුදල් ප්‍රමාණයක් ඇතුලත් වන අවස්ථාවක (2) වන උපවගන්තිය යටතේ රඳවා ගැනීමේ පිරිවැටුම බද්දක් ගෙවා ඇති බවට (අ) අනුවගන්තිය යටතේ ඔහු වෙත නිකුත් කරන ලද වවුචරය ඉදිරිපත් කිරීම මත ඔහු විසින් එකී කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ඒ වවුචරයේ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද ලෙස දක්වා ඇති මුදල අඩු කර ගැනීමට හෝ පිරිවැටුම් බද්දට හිලවු කිරීමට හෝ මිලට ගන්නෙකුට හිමිකම ඇත්තේ ය.

*ගිවිසුම්ගත ගෙවීම් වලින් පිරිවැටුම් බදු අඩුකිරීම.*

(5) බස්නාහිර පළාත තුල සිදු වූ යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් ගිවිසුමට එළඹියේ මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙර වුවද, නොවුවද යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් තමා පාර්ශවයක්ව සිටින්නාවූ ගිවිසුමක් ප්‍රකාර හෝ ගිවිසුමකට පාර්ශවයක් වන්නා වූ වෙනත් යම් තැනැත්තකු හෝ ආයතනයක් වෙනුවෙන් ඒ ගිවිසුම ප්‍රකාර යම් ගෙවීමක් කරන ලද අවස්ථාවක අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් කලින් කලට නියම කරනු ලබන අනුප්‍රමාණයකට ඒ ගෙවීමේ ප්‍රතිශතයක් විය යුතු පිරිවැටුම් බද්දක් ඒ ගෙවීම කරන සෑම තැනැත්තකු හෝ ආයතනයක් විසින් ම එම මුදල් ගෙවීමේදී අඩුකර ගනු ලැබිය යුතු ය. තවද, එසේ අඩුකර ගන්නා ලද පිරිවැටුම් බදු මුදල ඒ තැනැත්තාගෙන් හෝ ආයතනයෙන් බස්නාහිර පළාත් සභාවට අය විය යුතු ණයක් විය යුතු අතර, ඒ ණය මුදල අයකර ගනු ලැබිය යුතු ය. නැතහොත් ඒ තැනැත්තා හෝ ආයතනය විසින් මේ ප්‍රඥප්තිය යටතේ ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දක් වේ ද ඒ පිරිවැටුම් බද්දට අමතරව ඒ ණය මුදල තක්සේරුකර ඒ තැනැත්තාගෙන් හෝ ආයතනයෙන් අයකර ගනු ලැබිය හැකි ය. එසේ වුවද, ඒ ගිවිසුම ඉටුකිරීමෙහිලා ගෙවිය යුතු මුළු ප්‍රතිෂ්ඨාව රුපියල් ලක්ෂයක් නොඉක්මවන්නේ නම් එවැනි අඩු කිරීමක් නොකළ යුතු ය.

*අඩු කල පිරිවැටුම් බද්ද වෙනුවෙන් සහතික නිකුත් කිරීම.*

(6) (අ) (5) උප වගන්තියේ විධිවිධාන අනුව පිරිවැටුම් බද්ද අඩුකර ගනු ලබන්නා වූ යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින්, ඒ අඩුකර ගනු ලැබීම කරන ලද්දේ යම් තැනැත්තකු හෝ ආයතනයක් වෙත කරන ලද ගෙවීමකින් ද, ඒ තැනැත්තාට හෝ ආයතනයට,

(1) ගෙවන ලද මුදල,
(11) අඩුකර ගන්නා ලද බදු අනුප්‍රමාණය සහ බදු මුදල් ප්‍රමාණය,
(111) නියම වශයෙන් ගෙවන ලද ශුද්ධ මුදල.

දැක්වෙන සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) අනු වගන්තිය යටතේ එසේ අඩුකර ගැනීම කරනු ලැබූ දින සිට දින හතක් ඇතුලත එම මුදල සම්බන්ධයෙන්,

(1) ගෙවීම කරන ලද්දේ යම් තැනැත්තකු හෝ ආයතනයකටද ඒ තැනැත්තාගේ හෝ ආයතනයේ නම සහ ලිපිනය.
(11) එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය,
(111) අඩුකර ගන්නා ලද බදු අනුප්‍රමාණය සහ බදු මුදල් ප්‍රමාණය,
(1v) නියම වශයෙන් ගෙවන ලද ශුද්ධ මුදල.

දැක්වෙන සහතිකයක් එම පිරිවැටුම් බද්ද අඩුකර ගනු ලබන්නා වූ තැනැත්තා හෝ ආයතනය විසින් කොමසාරිස්වරයා වෙත එවිය යුතු ය.

*ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් විධිවිධාන අදාළ නො ගත හැකි බව*

(7) එක් එක් කාර්තුවකදී පිරිවැටුම දැක්වෙන වාර්තා සැපයිමට, බදු ගෙවීමට, පිරිවැටුම් බද්දක් අයකර ගැනිමට, ගෙවීම් පැහැර හැරීමේ දී නෛතික ක්‍රියා මාර්ග ගැනිමට, දණ්ඩන පැනවීමට සහ පිරිවැටුම් බදු ආපසු ගෙවීමට අදාළ මේ ප්‍රඥප්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ රඳවා ගැනිමේ පිරිවැටුම් බද්දට අදාළව හෝ ඒ පිළිබඳ වාර්තා සැපයිමට, බදු ගෙවීමට, බද්දක් අයකර ගැනිමට, ගෙවීම් පැහැර හැරීමේ දී නෛතික ක්‍රියා මාර්ග ගැනිමට, දණ්ඩන පැනවීමට සහ පිරිවැටුම් බදු ආපසු ගෙවීමට ද ඒ ආකාරයෙන් ම අදාළ විය යුතු ය.

*අර්ථ නිරූපනය.*

(8) (අ) මේ වගන්තියේ කාර්යය සඳහා "ගිවිසුම" යන්නෙන් -

(i) කවර වූ හෝ ස්වභාවයක පාරිභෝගික ද්‍රව්‍ය හෝ භාණ්ඩ සැපයිම සම්බන්ධයෙන් වූ ගිවිසුමක්,

(ii) (i) අනුවගන්තියේ සඳහන් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් වූ අනුගිවිසුමක් අදහස් වේ.

එසේද වුවත්, නිෂ්පාදකයකු හෝ සේවා සැපයිම් කරන්නෙකු සමඟ වූ ගිවිසුමක් මෙම වගන්තියේ කාර්යයන් සඳහා ගිවිසුමක් ලෙස අර්ථ නොදැක්විය යුතු ය.

(ආ) මේ වගන්තියේ කාර්යය සඳහා "ආනයනකරුවෙකු" යන්නෙන් යම් පාරිභෝගික ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් නැවත විකිණීම සඳහා ණයට හෝ අත්පිට මුදලට තොග වශයෙන් වෙළඳම් කරන තැනැත්තෙකු අදහස් වේ.

(ඇ) මේ වගන්තියේ කාර්යය සඳහා "නිෂ්පාදකයෙකු" යන්නෙන් යම් පාරිභෝගික ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් නැවත විකිණීම සඳහා ණයට හෝ අත්පිට මුදලට තොග වශයෙන් වෙළඳම් කරන තැනැත්තෙකු අදහස් වේ.

(ඈ) මේ වගන්තියේ කාර්යය සඳහා "විකුණුම්කරුවෙකු" යන්නෙන් යම් පාරිභෝගික ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් නැවත විකිණීම සඳහා ණයට හෝ අත්පිට මුදලට තොග වශයෙන් වෙළඳම් කරන තැනැත්තෙකු අදහස් වේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 34(අ) උප වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (අ) යන උප වගන්තියේ "10 වන වගන්තියේ හෝ 30 වන වගන්තියේ හෝ 31 වන වගන්තියේ" යන වචන වෙනුවට "10 වන වගන්තියේ හෝ 11 වන වගන්තියේ හෝ 12 වන වගන්තියේ හෝ 30 වන වගන්තියේ හෝ 31 වන වගන්තියේ හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 34(ආ) උප වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (ආ) යන උප වගන්තියේ "10 වන වගන්තිය හෝ 79 වන වගන්තිය" යන වචන වෙනුවට "10 වන වගන්තිය හෝ 11 වන වගන්තිය හෝ 12 වන වගන්තිය හෝ 79 වන වගන්තිය හෝ " යන වචන ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 34(ඇ) උප වගන්තිය සංශෝධනය කිරීම.*

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (ඇ) යන උප වගන්තියේ "10 වන වගන්තිය හෝ 79 වන වගන්තිය" යන වචන වෙනුවට "10 වන වගන්තිය හෝ 11වන වගන්තිය හෝ 12 වන වගන්තිය හෝ 79 වන වගන්තිය හෝ"" යන වචන ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 85(1) උප වගන්තිය සංශෝධනය කිරීම.*

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "මේ පරිච්ඡේදයේ 'බද්ද' යන්නෙහි 'පිරිවැටුම් බද්දක්' සහ මුද්දර ගාස්තුවක් සහ ඒ 'පිරිවැටුම් බද්දට' හෝ 'මුද්දර ගාස්තුවට' " යන වචන වෙනුවට "මේ පරිච්ඡේදයේ 'බද්ද' යන්නෙහි 'පිරිවැටුම් බද්දක්' හෝ 'රඳවා ගැනිමේ පිරිවැටුම් බද්දක්' හෝ 'තැගි තරඟ බද්දක්' හෝ 'මුද්දර ගාස්තුවක්' සහ ඒ 'පිරිවැටුම් බද්දට' හෝ 'රඳවා ගැනිමේ පිරිවැටුම් බද්දට'හෝ 'තැගි තරඟ බද්දට'හෝ 'මුද්දර ගාස්තුවට' හෝ " යන වචන ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 85(2) උප වගන්තිය සංශෝධනය කිරීම.*

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "4 වන වගන්තිය සහ 57(1) (ආ) වගන්තිය යටතේ වූ " යන වචන වෙනුවට "4 වන වගන්තිය යටතේ වූ හෝ 13 වන වගන්තිය යටතේ වූ හෝ 14 වන වගන්තිය යටතේ වූ හෝ 57(1) (ආ) වගන්තිය යටතේ වූ හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනුශාව ලබා දෙමි

දිනය 2009.01.28 [illegible] ලොකු බණ්ඩාර

[illegible]

[illegible] පළාත.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 87(2) උප වගන්තිය සංශෝධනය කිරීම.*

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "පැහැර හැර ඇති තැනැත්තා විසින් 57(1) (ආ) වගන්තිය යටතේ වු "යන වචන වෙනුවට "පැහැර හැර ඇති තැනැත්තා විසින් 13 වන වගන්තිය යටතේ වු හෝ 14 වන වගන්තිය යටතේ වු හෝ 57(1) (ආ) වගන්තිය යටතේ වු හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 87(3) උප වගන්තිය සංශෝධනය කිරීම.*

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ වගන්තියේ කුමක් සඳහන් ව ඇත ද 57(1) (ආ) වගන්තිය යටතේ වු " යන වචන වෙනුවට "මේ වගන්තියේ කුමක් සඳහන් ව තිබුන ද 13 වන වගන්තිය යටතේ වු හෝ 14 වන වගන්තිය යටතේ වු හෝ 57(1) (ආ) වගන්තිය යටතේ වු හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*2006 අංක 2 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 98(1)(ආ) අනු වගන්තියට ඉක්බිතිව අළුත් අනු වගන්තියක් ඇතුල් කිරීම.*

10. 2006 අංක 2 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) අනු වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අනු වගන්තිය ඇතුලත් කිරීමෙන් ඒ වගන්තිය තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

"(ඇ) ජාතික හෝ ආගමික හෝ සංස්කෘතික හෝ වැදගත්කමක් ඇති යම් උත්සවයක් අරමුණු කරගෙන රජය විසින් හෝ යම් ප්‍රජා සංවිධානයක් විසින් හෝ සංවිධානය කරනු ලබන සෑම තෑගි තරඟයක් ම තෑගි තරඟ බද්දෙන් නිදහස් විය යුතු ය"

*2006 අංක 2 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 98(5)(ඇ) අනු වගන්තිය සංශෝධනය කිරීම.*

11. 2006 අංක 2 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ඇ) අනු වගන්තියේ "පැනවෙන දඩ පළාත් සභාවට අයවිය යුතු ණයක් ලෙස සලකා අය කර ගත යුතුය" යන වචන වෙනුවට "පැනවෙන දඩ ද ඊට ඇතුලත් වේ." යන වචන ආදේශ කිරීමෙන් ඒ අනු වගන්තියේ මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*2006 අංක 2 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 98(9)(ආ) අනු වගන්තියට ඉක්බිතිව අළුත් අනු වගන්තියක් ඇතුල් කිරීම.*

12. 2006 අංක 2 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තියේ (9) වන උපවගන්තියේ (ආ) අනු වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අනු වගන්තිය ඇතුලත් කිරීමෙන් ඒ වගන්තිය තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

"(ඇ) මෙම වගන්තියේ කාර්යයන් සඳහා 'ප්‍රජා සංවිධානයක් විසින් සංවිධානය කරනු ලබන තෑගි තරඟයක්' යන්නෙන් ලියාපදිංචි කල යම් සමිතියක් විසින් ජාතික හෝ ආගමික හෝ සංස්කෘතික හෝ වැදගත්කමක් ඇති යම් උත්සවයක් අරමුණු කර සංවිධානය කරනු ලබන තෑගි තරඟයක් හෝ ප්‍රදේශයේ ප්‍රාදේශිය ලේකම් විසින් ජාතික හෝ ආගමික හෝ සංස්කෘතික හෝ වැදගත්කමක් ඇති යම් උත්සවයක් අරමුණු කර සංවිධානය කරන ලද තෑගි තරඟයක් බවට ලිපියක් මගින් තහවුරු කරන එම බල ප්‍රදේශයේ යම් සංවිධානයක් විසින් සංවිධානය කරනු ලබන තෑගි තරඟයක් හෝ අදහස් වේ."

*අනනුකුලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.*

13 මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.